මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தோட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

e-mail: psc.cp.gov@gmail.com
web site: www.psc.cp.gov.lk

කාර්යාලය / காரியாலயம் / Office – 081-2213097
ලේකම් / செயலாளர் / Secretary – 081-2213096
වට්ස් ඇප් අංකය / வட்ஸ்அப் இல. / Whatsapp No – 0707213097
ෆැක්ස් / பெக்ஸ் / Fax – 081-2213082

මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/10/SUP/AT/2026
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2026.07.21

මධ්‍යම පළාතේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

**මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ වාර්ෂික ස්ථාන මාරු -2026**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ අංක CPC/PSC/40/18/2026 හා 2025.11.14 දිනැති ලිපිය මඟින් නිකුත් කරන ලද මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණිය - 2026 අවසන් වාර්ෂික ස්ථාන මාරු නියෝග ඇතුළත් ලේඛනය හා බැඳේ.

02. ඒ මඟින් , 2026.01.01 දින සිට ක්‍රියාත්මක කළ යුතුව තිබූ මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්ගේ ස්ථාන මාරු, නව බඳවා ගැනීම් හා සමගාමීව සිදුකිරීම යුදුසු බවට ලබාදුන් ස්ථාන මාරු කමිටු තීරණය දැනුම් දීම සිදු කර ඇත.

03. ඒ අනුව, මේ වන විට නව බඳවාගැනීම් සිදුකිරීමට අදාළ කටයුතු සිදුකරමින් පවතින බැවින්, 2026.01.01 දින සිට ක්‍රියාත්මක කළ යුතුව තිබූ අදාළ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු නව බඳවා ගැනීම් සිදුකිරීම හා සමගාමීව සිදුකිරීමට හැකියාව පවතින බැවින්, ඒ සඳහා මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GCP/02/AT-202 හා 2026.07.21 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.

04. අපගේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති කළමනාකරණ සේවා අධිශ්‍රේණියේ නිලධාරීන්ගේ 2026 වසරේ යෝජිත වාර්ෂික ස්ථානමාරු නියෝග සහිත ලේඛනය භාගත කරගන්නා ලෙස මෙයින් දන්වමි.

05. තවද, වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව ඔබ කාර්යාලය යටතේ ඇති උප කාර්යාලය සහ වෙනත් සේවා ස්ථාන වෙත අනුයුක්ත කර ඇති සියළුම නිලධාරීන්ද දැනුවත් කරන ලෙස හා ඒ පිළිබඳව අභියාචනා ඇත්නම් අපගේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති පහත සඳහන් අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පතේ ආකෘති පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර, ආයතන ප්‍රධානියා මඟින් පමණක් **2026.08.05** දිනට පෙර මෙම කොමිෂන් සභාව වෙත එවිය යුතු අතර, එදිනට පසුව ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් සලකා බැලීමක් සිදු නොකරන බවද, වැඩිදුරටත් සඳහන් කරමි.

| | |
|---|---|
| ම.ප/වා.ස්.මා/SUP-02 | මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණිය යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ **අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත.** |

06. අභියාචනා තීරණයන්ට පසු අවසන් ස්ථාන මාරු නියෝග අනුව, කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්ගේ නව පත්වීම් ක්‍රියාත්මක වන දින සිට වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග ක්‍රියාත්මක සියළුම නිලධාරීන් නව සේවා ස්ථාන වෙත අනිවාර්යයෙන්ම මුදාහැරිය යුතු බව මෙයින් කාරුණිකව දන්වමි.

කේ.කේ.ජී.අයි.ඩී.පී.විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
මධ්‍යම පළාත.

පිටපත - විගණකාධිපති - අ.ක.ස.